# චින්තනය හා සමාජය

සිංහල බෞද්ධ චින්තනයේ පරාජය පිළිබඳ තවත් බොහෝ දේ කිවයුතුව ඇතත් මේ ඒ සඳහා අවස්ථාව නො වේ. එහෙත් කරුණක් දෙකක් නොකියා ම බැරි ය. සමාජය යනු විකාශය වන්නකි. එලෙස ම සමාජයෙහි ජීවත්වන පුද්ගලයෝ ද විකාශය වෙති. චින්තනය විසින් සමාජය වෙනස් කෙරෙන අතර සමාජ විකාශය විසින් චින්තනය ද වෙනස් කෙරෙයි. ඇතැම් සමාජයකට ඇතැම් චින්තනයක් කිසිසේත්ම ගැලපෙන්නේ නො වේ. ඇස්කිමෝ සමාජයෙහි සිංහල බෞද්ධ චින්තනයක් ගැන කතාකිරීම ම විහිළුවකි.

මේ බව එලෙස ම සඳහන් නොවුණ ද, බෞද්ධ සාහිත්‍යයෙන් අපට ඒ සඳහා උදාහරණ සොයාගත හැකි ය. බෝසතාණන් වහන්සේ මෙළොව ඉපදීමට පෙර පස්මහාබැලුම් බැලූසේක. එහි තේරුම කුමක් ද? උන්වහන්සේ බුදුවීමෙන් පසු ලෝකෝත්තර වශයෙන් ගත්කල නිවන් මග හෙළිකළහ. ලෞකික වශයෙන් ගත්කල වත්මන් වචනවලින් කියන්නේ නම් බුදුන් වහන්සේ නව සුසමාදර්ශයක් හා චින්තනයක් හඳුන්වා දුන්හ. මෙළොව ඉපදීමට පෙර බෝසතාණන් වහන්සේට අවශ්‍ය වූයේ ඒ චින්තනය පිළිගන්නා සමාජයක් දීපයක් දේශයක් ආදී වශයෙන් ඇත්දැයි සොයා බැලීම ය. පස්මහාබැලුම් බැලූවේ ඒ සඳහා ය.

බුදුවීමෙන් පසුව ද තමන්වහන්සේගේ ධර්මය අනෙක් අයට තේරුම් ගත හැකිවේ ද යන ප්‍රශ්නය උන්වහන්සේට විය. අප කැමති වුවත් අකමැති වුවත් පිළිගත යුතු දෙයක් වෙයි. බුදුන් වහන්සේගේ ධර්මය දඹදිව පැවතුණේ සියවස් කිහිපයක් පමණක් බව ය. බුද්දදහමේ ඇතැම් අංග පසුව බිහිවූ හින්දු ආගමට (හින්දු ආගම බිහිවූයේ හයවැනි සියවසේ පමණ ශංකරාචාර්යවරයාගෙන් පසුව ය. සිදුහත් කුමරු ඉපදුණේ හින්දු සමාජයකයැයි කලක් ඉන්දියාවේ ජනාධිපති ව සිටි සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් මහතා ඇතුළු බොහෝ පඬිවරුන් කියා ඇති නමුදු එහි සත්‍යතාවක් නැත.) ඇතුළත් වී ඒ ඔස්සේ වත්මන් ඉන්දියාවේ ද දැකිය හැකි බව සැබෑ ය. එහෙත් අද බෞද්ධ චින්තනයක් හෝ සංස්කෘතියක් හෝ ඉන්දියාවේ දක්නට නැත.

අශෝක රජු මැදිහත් වී මිහිඳු මහා රහතන්වහන්සේ මගින් මෙරටට බුද්දදහම නිල වශයෙන් හඳුනා නොදෙන්නට මුළු ලෝකයෙන් ම බුද්දදහම අතුරුදහන් වී යැමට ඉඩ තිබුණි. වෛදික ආක්‍රමණයට ලක්වූ දඹදිව බුද්දදහමට තිබුණේ අල්පායුෂ ය. සිදුහත් කුමරු උපන්නේ ද අර්ධ වෛදික සමාජයක බව අමතක නො කළ යුතු ය. එතුමා මුළුමණින් ම වෛදික වූ සමාජයක ඉපදිණි නම් බුද්දදහමට හිස එසවීමටවත් ඉඩක් නොලැබෙනු නොඅනුමාන ය. එහෙත් බුද්දදහමට තරමක හෝ වෛදික සංස්කෘතියක් ද අවශ්‍ය විය. යම් අයුරකින් බෝසතාණන් වහන්සේ චීනයෙහි ඉපදිණි නම් එවිට ද බුද්දදහමට ඉඩක් නොලැබෙන්නට තිබිණි.

බෝසතාණන් වහන්සේ ලංකාවේ ඉපදිණි නම් එවිට ද බුද්දදහමට එවැනි ම වූ ඉරණමක් ලැබෙන්නට තිබිණි. උන්වහන්සේ ඉපදෙන කාලයෙහි ලංකාව අවශ්‍ය ප්‍රමාණයට අර්ධ වෛදික වී නොතිබිණි ය යන්න මගේ නිගමනය වෙයි. යක්ෂ ගෝත්‍රිකයන් බලවත් ව සිටි සමාජයක බුද්දදහමට තදබල විරෝධයක් ඇතිවීම වැළැක්විය හැකි නො වේ. පඬු අබා රජුට පෙර මෙරට අතරින් පතර බෞද්ධයන් සිටින්නට ඇත. ශාක්‍ය වාංශිකයකු වූ භද්දකච්චනා කුමරිය ද බෞද්ධ වන්නට ඉඩ ඇත. එහෙත් බුද්දදහම ව්‍යාප්ත වීමට සමාජයෙහි යක්ෂ ගෝත්‍රික බලපෑම අඩුවී අර්ධ වෛදික බලපෑම වැඩිවීම අවශ්‍ය විය. ඒ කරුණු දේවානම්පිය තිස්ස සමය වන විට ඉටුවීමෙන් පසුව පමණක් මෙරට බුද්දදහම ව්‍යාප්ත වීමට ඉඩකඩ සැලසිණි. පඬුඅබා කුමරු ඇතැම් යක්ෂයන්ගේ සහාය ලබාගෙන රජ වුව ද එතුමාගෙන් පසුව යක්ෂ බලය ක්‍රමයෙන් අඩුවන්නට පටන්ගෙන ඇති බව පෙනී යයි.

බුදු දහම ව්‍යාප්ත වීමේ දී නාග, දේව ආදී ගෝත්‍රිකයන්ගෙන් ලැබුණු ආධාරය ද සැලකිල්ලට ගත යුතු ය. යක්ෂ ගෝත්‍රිකයන් විරුද්ධ වුව ද නාග හා දේව ගෝත්‍රිකයෝ බුදු දහමට විරුද්ධ නො වූහ. සමන් දෙවියන් පිළිබඳ කතාවලින් ද චූලෝදර මහෝදර මෙන් ම මණිඅක්ඛික නා රජවරුන්ගේ කතාවලින් ද පැහැදිලි වන්නේ නාග හා දේව ගෝත්‍රිකයන් බුදුන් වහන්සේට හා බුදු දහමට දැක් වූ ගෞරවය ය. එවැනි ගෞරවයක් තිබියදී ද මහාවංශයට අනුව යක්ෂයන් දමනය කිරීමට බුදුන් වහන්සේ මහියංගනයට වැඩම කිරීමෙන් පෙන්නුම් කරන්නේ ලංකාවේ බුදු සමය පැතිරීමට බුදුන් වහන්සේ වැඩ විසූ කාලයෙහි සුදුසු වාතාවරණයක් නොතිබි බව ය.

© Prof. Nalin De Silva

භාරතයෙන් බුද්ධදහම නැති වී ගිය ද ලංකාවේ අපට බුද්ධදහම රැකගැනීමට හැකිවූයේ බුද්ධදහමේ ව්‍යාප්තියට අඩුම තරමින් කඩා නොවැටීමට අවශ්‍ය සමාජ ක්‍රමය යම් දුරකට නො වෙනස්ව තබාගැනීමෙනි. මහායානයට ගොදුරුවීමට තිබුණු ථෙරවාදී බුද්ධදහම ආරක්ෂා කිරීමට පස්වැනි සියවසේ වැඩඋන් භික්ෂූන්වහන්සේ ඇතැම් පියවර ගත්හ. ඒ පියවර අතර බුද්ධදහම ආශ්‍රිත කෘති සිංහලෙන් පාළි භාෂාවට පෙරළීමක් ද විය. ඒ ක්‍රියාවෙන් දහම ආරක්ෂා වූ බව රහසක් නොවිය යුතු ය. සිංහල හා ආන්ද්‍ර ප්‍රදේශ භික්ෂූන් වහන්සේ එකතු වී පස්වැනි සියවසේ පමණ ගත් තීරණය වූයේ ථෙරවාදය ආරක්ෂාකිරීමට නම් මහායාන චින්තනයට වැට බැඳිය යුතු බව හා සතුරු පරිසරයක ථෙරවාදයට වුව ද වැඩෙන්නට ඉඩ නොදිය යුතු බව ය. දහම් පොත් සිංහලෙන් පාළියට පරිවර්තනය කෙරුණේ ඒ අනුව ය. උන්වහන්සේ ඒ අනුව කටයුතු නොකරන්නට කලින් කියා ඇති පරිදි මේ වන විට අප හින්දූන් වී අවසාන ය.

අද මුළු ලෝකය ම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට යට වී ඇත. ඉන්ද්‍රිය පිනවීම, වෙන් කිරීම හා වෙන් වීම, ස්වභාව ධර්මය මිනිසා වෙනුවෙන් මවා ඇති බව පිළිගැනීම ආදිය ඒ චින්තනයෙහි වෙයි. අද මිනිස්සු ඒ සියල්ලට කැමති වෙති. ස්වාභාවිකව මිනිසුන් යොමු වන්නේ ද ඒ පිළිගැනීමට ය. එහෙත් මෙහි කෙළවරක් වෙයි. දැනට ඇති සීමිත සම්පත් හිඟ වූ කල අප එකිනෙකාගෙන් වෙන් ව ඒවා ලබාගෙන ඉන්ද්‍රිය පිනවීමට එකිනෙකා සමග තරග වදින විට අපට අනෙක් අය සතුරන් ලෙස පෙනෙනු ඇත.

මුරුගසංවරුසාවට තෙමුණු විට ද එකිනෙකා සතුරන් මෙන් පෙනෙන්නට ගන්නේ යැයි කියමනක් තිබේ. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි කෙළවර ද ඇත්තේ එවැනි විනාශයකි. ඒ විනාශයට කලින් හෝ ඒ විනාශයත් සමග හෝ මිනිසුන්ට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි මානව හා ස්වභාව ධර්ම (පරිසර) විරෝධී බව වැටහෙනු ඇත. එවිට සමාජයට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි අදාළ බවක් වලංගු බවක් නැතිවනු ඇත. ලෝකයාට වෙනත් චින්තනයක අවශ්‍යතාව එලෙස දැනෙනු ඇත.

ඇතැම් විට ඉහත කී අන්දමේ තත්වයක් උදාවීමට පෙර ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය සමාජයේ අවලංගු වී ඇති බව මිනිසුන්ට දැනෙනු ඇත. ඔවුන්ට නව චින්නනයක් අවශ්‍ය වනු ඇත. ඒ චින්තනය අන් කිසිවක් නොව සිංහල ථෙරවාදී බෞද්ධ චින්තනය වෙයි. ස්වභාව ධර්මය සමග සහජීවනයෙන් හා එකිනෙකා අතර වූ සාමූහිකත්වයෙන්, එමෙන් ම සාමූහිකත්වය හා පෞද්ගලිකත්වය අතර මනා සමතුලනයකින්, තම අවශ්‍යතා හැකිතාක් අඩුකරගනිමින්, බහුභාණ්ඩිකත්වය පිළිකෙව් කරමින්, මමත්වය තුනීකරගනිමින් සකස්කරගන්නා ජීවන ක්‍රමයක් මිනිසුන්ට අවශ්‍ය වෙයි.

පරිසරය ගැන අප කතාකරන්නට පටන්ගත්තේ දැනට අවුරුදු විසිපහකටත් පෙර කිසිම දේශපාලන පක්ෂයක් හෝ ජාතික සංවිධානයක් ඒ ගැන සිතීමටවත් පටන්ගෙන නොතිබූ අවධියක බව මෙහිලා සඳහන් කළ යුත්තේ අද ඒ පිළිබඳ අවධානයක් සමාජයෙහි ඇති බැවිනි. එහෙත් කිවයුත්තක් ඇත. බටහිර රටවල ද පරිසරය සුරැකීම ගැන සාකච්ඡා ආරම්භ වී ඇත. එසේ ආරම්භ වූයේ අප ඒ ගැන සඳහන්කිරීමට පෙට බව අප පිළිගත යුතු ය. එහෙත් පරිසරය ගැන කතාකරන බටහිර විද්‍යාඥයන්ට සීමා පැන වී ඇත. ඔවුන් කටයුතු කරන්නේ ම බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. මේ චින්තනය අවුරුදු විසිපහකට පමණ පෙර අප විසින් හඳුන්වනු ලැබූයේ යුදෙව් චින්තනය නමින් බව සඳහන් කළ යුතු ය. එකල ජාතික චින්තනය යන වචන දෙක සමාජයේ අසන්නට නො ලැබිණි. චින්තනය යන්න අප විසින් මුල සිට ම යොදාගනු ලැබූයේ නිශ්චිත සංකල්පයක් ප්‍රකාශ කිරීමට මිස විසිරුණු අදහසක් ප්‍රකාශ කිරීමට නො වේ. සිංහල බෞද්ධකම යනු කුමක්දැයි නිශ්චිතව පැහැදිලිව නොකියා සිංහල බෞද්ධ ආර්ථිකයක් ගැන කතාකිරීමේ තේරුමක් නැත.

සිංහල බෞද්ධ ආර්ථිකයක් හෝ ජාතික චින්තනයක් හෝ ගැන කතාකරමින් බටහිර විද්‍යාව හා තාක්ෂණය අනුගමනය කිරීම තරම් අමනොඥ ක්‍රියාවක් තවත් නැත. බටහිර විද්‍යාවට හා තාක්ෂණයට කිසි දිනෙක පරිසරය රැකිය හැකි නො වේ. අද බටහිර විද්‍යා ප්‍රාථමාලාවල ද පරිසර සංරක්ෂණය උගන්වනු දැකිය හැකි ය. එහෙත් බටහිර තාක්ෂණය මිනිසාගේ ඊනියා සුබ විහරණය සඳහා පරිසරය විනාශ කරමින් සිටිය දී පරිසරය රැකීම ගැන කතාකිරීම ම විහිළුවකි. මේ සම්බන්ධ ඇතැම් කරුණු පරිසරය හා බටහිර ආකල්ප නමින් පළවී ඇති කෘතියෙහි සඳහන් වෙයි.

© Prof. Nalin De Silva

සංවර්ධනයේ සීමා (Limits to growth) යන ලේඛනය බටහිර පළ වී අවුරුදු පණහක් පමණ වෙයි. ඉන් කියැවුණේ සම්පත් (resources) ක්ෂය වී යැමත් සමග බටහිර වර්ධනයට සීමා පැනවෙන බව ය. එහෙත් බොහෝ බටහිර උගත්තු හා බුද්ධිමත්තු එයට විරුද්ධවූහ. ඔවුන් කියා සිටියේ බටහිර විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමග වෙනත් සම්පත් සොයාගනු ඇති බව ය. වෙනත් ග්‍රහලෝකවලින් පවා සම්පත් (ඉන්ධන ආදිය) ගෙන එමට ඇතැම්හු කතාකළහ. එබැවින් ටික කලකින් ම සංවර්ධනයේ සීමා යන්න බටහිර සාකච්ඡාවට ලක් නොවූ කරුණක් විය. කෙසේ වුවත් බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට සංවර්ධනයේ සීමා යන්න ආගන්තුක සංකල්පයක් වෙයි.

තම පෞද්ගලික අවශ්‍යතා වැඩිකරන, ඉන්ද්‍රිය පිනවීම වර්ධනය කරන, ස්වභාව ධර්මය මිනිසා වෙනුවෙන් මවා ඇතැයි කියන චින්තනයක ඊනියා සංවර්ධනයට සීමා තිබිය හැකි නො වෙයි. සංවර්ධනයේ සීමා යන්න බටහිර සුළු ධාරාවේ සංකල්පයක් විය. නොබෝ කලකින් ම ඒ පරාජය වීම පුදුමයට කරුණක් නො වේ. සිංහල බෞද්ධ චින්තනයෙහි සංවර්ධනයට සීමා යන සංකල්පය ම නැත. සීමාව යන සංකල්පය ඇතිවන්නේ සංවර්ධනය සීමාවක් නැතිව සිදුවන්නේ ය  යන සංකල්පය ඇතිවිට ය. සිංහල බෞද්ධයනට එවැනි අසීමිත නොව කිසිම සංවර්ධනයක් නැත. සිංහල බෞද්ධයනට ඇත්තේ සහජීවනය සමතුලනය වැනි සංකල්ප මිස සංවර්ධනය යන්න නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva